# දෙවන භාෂා ඉගැන්වීමේ ක්‍රමවේද සහ ඒවායින් ශ්‍රී ලංකාවට වඩාත් යෝග්‍ය ක්‍රමය

තෙරිපැහැ උපනන්ද හිමි

## Abstract

There are two types of Language Teaching Methodologies: Mother Language Teaching and Second or Foreign Language Teaching. This study mainly focuses on Second or Foreign Language Teaching. When examining the history of Second or Foreign Language Teaching, it can be assumed through the historical evidence such as, the Indian monks who brought Buddhism from India to China and the maha theros like Buddhagosa who have provided the commentaries to Theravada Pali Tripitaka of Sri lanka, that various language teaching methods may have beenused. They may have lost since there wasn't a suitable procedure of updating. The studies on innovations of Second or Foreign Language Teaching brought about after 1900 with the advent of restoration period in Europe. Up to now, Language Teaching Methods have been an active field of study. Meanwhile,Various Language Teaching Methods have been tested. This study focuses on to these innovations of

Second or Foreign Language Teaching methods. The aim of this study is to throw the light on major and minor innovative methods of therein. The research problem is what the methods of Second or Foreign Language Teaching, the advantages and disadvantages of the mand the most suitable methods of Second or Foreign Language Teachings in Sri Lanka. This research is based on qualitative research. Data were collected from secondary sources. When analysing data, the language teaching methodology in the last few decades and the most suitable method to teach a Second or Foreign language of Sri Lanka are inquired and identified. It is expected to investigate about Second or Foreign Language Teaching methodologies with special reference to the factors that needs focusing in terms of as Applied Linguistics.

***Keywords :*** *Methods, Second Languages, Languages Teaching, Applied Linguistics, Foreign Languages.*

**යතුරු පදඃ** ක්‍රමවේද, දෙවන භාෂා, භාෂා ඉගැන්වීම, ව්‍යවහාරික වාග්විද්‍යාව, විදේශ භාෂා,

## හැඳින්වීම

භාෂා ඉගැන්වීමේ ක්‍රමවේද සමුපලක්ෂිතව ඇත්තේ දෙවන හෝ විදේශ භාෂාවන් ඉගැන්වීමේ වඩාත් ඵලදායී ක්‍රමයන් සෙවීමෙනි. වසර සිය ගණනකට වැඩිකාලයක් තිස්සේ, වෘත්තීය ඉගැන්වීම තුළ කෙරුණු විවාද හා සාකච්ඡා බොහෝවිට කේන්ද්‍රගත වූයේ භාෂා විෂයමාලාවේ ව්‍යාකරණයේ භූමිකාව, ඉගැන්වීමේ නිවැරදි බව සහ චතුර බව වර්ධනය කිරීම, විෂයමාලා සැලසුම්කිරීමේදී විෂය නිර්දේශ රාමු තෝරා ගැනීම, භාෂා ඉගෙනීමේදී වචනමාලාවේ කාර්යභාරය, ඉගැන්වීමේ ඵලදායීතාව සහ වටහාගැනීමේ හැකියාවන්, ඉගෙනීමේ න්‍යායන් සහ ඉගැන්වීමේදී ඒවායෙහි භාවිතය, කටපාඩම්කිරීම සහ ඉගෙනීම, ඉගෙනගන්නන් පෙලඹවීම, ඵලදායී ඉගෙනුම් උපායමාර්ග, සිව් කුසලතා ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම සහ උපකරණ හා තාක්ෂණයේ කාර්යභාරය වැනි කරුණු මතය. ව්‍යවහාරික වාග්විද්‍යාව භාෂා

ඉගැන්වීමේදී හමුවන මෙම ප්‍රශ්න සහ වෙනත් වැදගත් ප්‍රශ්න සඳහා බොහෝ පැහැදලි කිරීම්, නිරාකරණය කිරීම් සිදු කර ඇතත් වෘත්තීයමය ඉගැන්වීම යන ක්ෂේත්‍රය මගින් මෙම මූලික ගැටලු ඵලදායීව විසඳීම සඳහා නිරන්තරයෙන් නව විකල්ප ගවේෂණය කරමින් සිටී.

සාමාන්‍යයෙන් ඕනෑම විෂයක ඉගැන්වීම පදනම් වනුයේ එම විෂය ස්වභාවය සහ ප්‍රතිපත්ති (අධ්‍යාපන මනෝවිද්‍යා පර්යේෂණ සහ න්‍යායන් මගින් උපුටාගත්) භාවිතය මතය. ඉගැන්වීමේ ක්‍රමවේද යන්නෙන්, අප ඒ ඉගැන්වීම සඳහා යොදාගන්නා ඉගෙනීම් ඉගැන්වීම් ප්‍රතිපත්ති, පන්තිකාමර ක්‍රියාකාරකම් ආදි ඒ හා සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් අදහස් කෙරේ. 1900 ගණන්වල සිට භාෂා ඉගැන්වීමේදී, ඉගැන්වීම් ක්‍රමවේද බොහෝ ක්‍රියාකාරී ක්ෂේත්‍රයක් බවට පත්ව තිබිණි. පසුව විසිවන සියවස පුරා මේ සම්බන්ධ නව ප්‍රවේශයන් සහ ක්‍රමෝපායන් ව්‍යාප්ත විය. සමහර ක්‍රමෝපායන් විවිධ කාලවලදී පුළුල් පිළිගැනීමක් හා ජනප්‍රියත්වයක් අත්කර ගත් නමුත් පසුව ඒවා වඩා සිත් ගන්නා අදහස් හා න්‍යායන් ඇතුළත් ක්‍රමෝපායන් සමඟ මිශ්‍ර වී ප්‍රතිස්ථාපනය විය. Direct Method (ඍජු ක්‍රමය), Audiolingualism (ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රමය), and Situational Approach යනාදිය ඒ සඳහා නිදසුන් ලෙස ඉදිරිපත් කළ හැකිය. Communicative Language Teaching (ප්‍රජා භාෂා ඉගැන්වීම) වැනි සමහර ක්‍රමෝපායන් ලෝක සම්මත ක්‍රමවේද බවට පත් විය. ඒ අතරම භාෂා ඉගැන්වීම තුළ ප්‍රධාන ධාරාවේ ප්‍රවේශයන් සඳහා යම් මට්ටමක සහයෝගයක් ලබාදෙන විකල්ප ක්‍රමවේද සොයාගෙන තිබේ. මෙම වර්ගයේ ක්‍රමවේද අතරට 1970 දශකයේ සිට Silent Way (නිහඬ ක්‍රමය), Counseling-Learning (උපදේශනය - ඉගැන්වීම), Suggestopedia, and Total Physical Response (සම්පූර්ණ ශාරීරික ප්‍රතිචාර) යනාදිය මෙන්ම Multiple Intelligence, Neurolinguistic Programming, the Lexical Approach වැනි වඩාත් නවීන විකල්ප ක්‍රම සහ ප්‍රවේශයන් ඇතුළත් වේ. මේ අනුව භාෂා ඉගැන්වීමේ ක්‍රමවේදයන්හි ප්‍රධාන මෙන්ම සුළු ප්‍රවණතාද හඳුනා ගත හැකිය.

## පර්යේෂණ අරමුණ

ඉගැන්වීම් ක්‍රමවේදවල නව ප්‍රවණතා සහ ඒවායෙහි ප්‍රධාන මෙන්ම සුළු ප්‍රවණතා කෙරෙහි අවධානය යොමු කිරීම, දෙවන හෝ විදේශ

භාෂාවක් ලෙස භාෂාවක් ඉගැන්වීම සඳහා ශ්‍රී ලංකාවට වඩාත් ගැළපෙන ඉගැන්වීමේ ක්‍රමවේදය හඳුනා ගැනීම මෙම අධ්‍යයනයෙහි අරමුණයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණයක් ලෙස සිදු කරන ලද මෙම පර්යේෂණයේදී වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ ද්විතීයික මූලාශ්‍රය ඇසුරින් දත්ත රැස් කරන ලදි.

## පර්යේෂණ ගැටලුව

දෙවන භාෂා ඉගැන්වීමේ ක්‍රමවේද කවරේද, ඒවායෙහි වාසි සහ අවාසි කවරේද, දෙවන භාෂාවක් ඉගැන්වීම සඳහා ශ්‍රී ලංකාවට වඩාත් ගැළපෙන ක්‍රමය කවරේද යනාදිය පර්යේෂණ ගැටලුව යි. දෙවන භාෂා ඉගැන්වීමේ ක්‍රමවේදය පසුගිය දශක කිහිපය තුළ වෙනස්කම්වලට භාජනය වී ඇත.

ඉගෙනුම් ක්‍රමවේද යනු භාෂාව ඉගෙනීම වඩාත් ඵලදායී සහ ප්‍රියජනක ක්‍රියාවලියක් කරවන හැසිරීම් හෝ ක්‍රියාකරකම් ලෙස නිර්වචනය කළ හැකිය.

විසිවන සියවසේ සහ විසි එක්වන සියවසෙහි ඉදිරිපත් කෙරුණු දෙවන හෝ විදේශ භාෂා ඉගෙනීම් ක්‍රම බොහෝ ප්‍රමාණයක් දක්නට ලැබෙන අතර ඒවායෙන් ප්‍රධාන ක්‍රමවේද කිහිපයක නම් මෙසේ සඳහන් කළ හැකිය. Grammar Translation Method, Direct Method, Audio-visual Method, Community Language Teaching, Silent Method, Natural Method, Communicative Language Teaching, Blend of Previous method, Total Physical Response, Community Language Learning, Task- based Language Learning, Eclectic Approach, Learning Strategy Training Cooperative Learning and Multiple Intelligences, Structural Approach යනාදියයි. මෙම ක්‍රමෝපායන් අතුරින් සමහරක් ලෝකය පුරා ඉතා ජනප්‍රිය වූ අතර සමහරක් ඒවා ජනප්‍රිය ක්‍රමයන් හා සම්මිශ්‍රණය විය. සමහර ඒවා යල්පැන ගිය ක්‍රමවේදයන් බවට පත්විය. අන්තර්ජාතික වශයෙන් භාවිත වුණු සහ ලංකාවේ පසුගිය දශක කීපයක් පුරාවට යොදා ගැනුණු ක්‍රමවේද කිහිපයක් මෙහිලා විස්තර කිරීම වටී.

1960 ගණන්වල අග භාගයේ සිට බ්‍රිතාන්‍ය භාෂා ඉගැන්වීම් සම්ප්‍රදායෙහි වෙනස්වීම් සිදුවීමත් සමඟ සන්නිවේදන භාෂා ඉගැන්වීමේ මූලාරම්භය සොයාගත හැකිය. එතෙක් Old Approach and Situational Language Teaching ක්‍රමවේදය විදේශ භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා යොදාගනිමින් තිබුණි. Situational Language ඉගැන්වීම් ක්‍රමය තුළ ක්‍රියාකාරී මූලික ව්‍යූහයන් (Practicing Basic Structure) උපයෝගීකොට ගෙන භාෂාව ඉගැන්වීම් සිදු කළේය. ව්‍යවහාරික වාග්විද්‍යාඥයන්ගේ ප්‍රශ්න කිරීම් හමුවේ 1960 ගණන්වල අග වන විට මෙම ක්‍රමය ප්‍රතික්ෂේප විය **(Howatt, 1984; 280)**.

1957 දී ඇමරිකානු ජාතික වාග්විද්‍යාඥයකු වන නෝම් චොම්ස්කි විසින් **Syntactic Structures** නමින් වාග්විද්‍යා ක්‍රමවේද ග්‍රන්ථයක් පළකරන ලදි. භාෂාවේ එකල සම්මත ව්‍යූහාත්මක න්‍යායන්, භාෂාවේ මූලික ලක්ෂණය වන තනි පුද්ගල වාක්‍යවල නිර්මාණශීලීත්වය සහ සුවිශේෂත්වය ගණනය කිරීමට අසමත් බව චොම්ස්කි කියා සිටියේය. මේ අතර හුදෙක් භාෂා ව්‍යූහයන්හි ප්‍රවීණතාවට වඩා සන්නිවේදන ප්‍රවීණතාව කෙරෙහි භාෂා ඉගැන්වීමේදී අවධානය යොමු කළ යුතු බව බ්‍රිතාන්‍ය ව්‍යවහාරික වාග්විද්‍යාඥයන් අවධාරණය කරන ලදි. එය භාෂා ඉගැන්වීමේ මූලික මානයක් හඳුන්වාදීමක්ද විය. Christopher Candlin සහ Henry Widdowson වැනි විද්වත්හු මේ මතය වෙනුවෙන් පෙනී සිටියහ. බ්‍රිතාන්‍ය වාග්විද්‍යාඥයන්ගේ ක්‍රියාකාරී නව විදේශ භාෂා ඉගැන්වීමේ ප්‍රවේශය සඳහා තවත් පෙලඹවීමක් යුරෝපයේ අධ්‍යාපන යථාර්ථයන් වෙනස්වීම නිසා ලැබුණේය. යුරෝපීය රටවල අන්තර්සම්බන්ධතා වැඩිවීමත් සමඟ යුරෝපීය පොදු වෙළෙඳපොළේ ප්‍රධාන භාෂාවන් වැඩිහිටියන්ට ඉගැන්වීමට අවශ්‍යතාවක් ඇති විය. සංස්කෘතික හා අධ්‍යාපනික සහයෝගීතාව සඳහා කලාපීය සංවිධානයක් වන යුරෝපා කවුන්සිලය ගැටලුව විමර්ශනය කළේ ය. අධ්‍යාපනය ඔවුන්ගේ ප්‍රධාන ක්‍රියාකාරකම්වලින් එකකි. එය අන්තර්ජාතික ඉගැන්වීම් සඳහා අනුග්‍රහය දැක්වූ අතර ජාත්‍යන්තර භාෂා ඉගැන්වීමේ ක්‍රමවේදයන් ප්‍රවර්ධනය කිරීමේදී ක්‍රියාකාරී විය. භාෂා ඉගැන්වීම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා අනුග්‍රහය දැක්වීය. භාෂා ඉගැන්වීම පිළිබඳ පොත් ප්‍රකාශයට පත් කරන ලදි.

අන්තර්ජාතික සංවර්ධනය සඳහා විකල්පයක් වූ භාෂා ඉගැන්වීමේ විකල්ප ක්‍රමවලට ඉහළ ප්‍රමුඛතාවක් දෙනු ලැබීය.

## ප්‍රජා භාෂා ඉගැන්වීම (Communicative Language Teaching)

1971 දී ප්‍රවීණයන් පිරිසක් ව්‍යවහාරික වාග්විද්‍යා සංගමයේ හැකියාව පිළිබඳ සොයා බැලීමට පටන් ගත්හ. මෙම කණ්ඩායම යුරෝපීය භාෂා ඉගෙන ගන්නන්ගේ අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනයන් භාවිත කළ අතර විශේෂයෙන් බ්‍රිතාන්‍ය වාග්විද්‍යාඥ Wilkins (1972) විසින් යෝජනා කරන ලද, භාෂා ඉගැන්වීමේදී සන්නිවේදන (Communication) විෂය නිර්දේශයන් සකස්කිරීම සඳහා පදනම් වශයෙන් යොදා ගත හැකි, ක්‍රියාකාරී සන්නිවේදන අර්ථ දැක්වීමක් (functional or communicative definition) ද අධ්‍යයනය සඳහා භාජනය කළේය. Wilkins එහිදී භාෂාවේ සන්නිවේදන භාවිතයන් පිටුපස ඇති අර්ථ පද්ධතිය පෙන්නුම් කළේය. පසුව ඔහු (1976) Notional syllabuses ග්‍රන්ථයක් ලෙස එම මතය සංශෝධනය කර ප්‍රකාශයට පත් කරන ලදි. එය සන්නිවේදන භාෂා ඉගැන්වීමේ (Communicative Language Teaching) වර්ධනයට සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. යුරෝපීය කවුන්සිලය භාෂා ඉගැන්වීම සඳහා, ක්‍රියාකාරී හා සන්නිවේදන ප්‍රවේශයක් ලෙස, න්‍යායාත්මක පදනමක් මත පිහිටා, Wilkins, Widdowson, Candlin, Christopher Brumfit, Keith Johnson සහ වෙනත් බ්‍රිතාන්‍ය ව්‍යවහාරික වාග්විද්‍යාඥයන්ගේ ලේඛන යොදා ගත්තේ ය. මේ හේතුවෙන් සන්නිවේදන භාෂා ඉගැන්වීම (Communicative Language Teaching) විෂය මාලා සංවර්ධන මධ්‍යස්ථානවල සිට රාජ්‍ය අනුග්‍රහය ලැබීම දක්වාත් අනතුරුව අන්තර්ජාතිකව ද බෙහෙවින් ජනප්‍රිය විය. විෂය පථය පුළුල් විය. භාෂා කුසලතා හතර ඉගැන්වීමේ ක්‍රියා පටිපාටි සංවර්ධනය සඳහා යොමු කෙරිණි.

සන්නිවේදන භාෂා ඉගැන්වීමේ (Communicative Language Teaching) ශක්තිමත් සහ දුර්වල අංශ Howatt පැහැදිලිව හඳුනා ගන්නා ලදි. පුරා වසර දහයක් පමණ අඩු හෝ වැඩි මට්ටමින් ක්‍රියාකාරී බවට පත්ව තිබූ මෙම ක්‍රමය භාෂා ඉගෙනුම්කරුවන් පීඩනයට පත් කරන බව Howatt දැක් වූ අදහස විය.

ලංකාවේ දෙවන භාෂා ඉගැන්වීමට වඩාත් සුදුසු ක්‍රමය ලෙස අධ්‍යාපන අමාත්‍යාංශ ජනාධිපති කාර්යය සාධක බලකාය විසින් මෙම ක්‍රමය හඳුන්වා දුණි. ඒ සඳහා බොහෝ මුදලක් වැය විය. එහිදී "English as a life skill" ඉංග්‍රීසි තමන්ගෙ ජීවිතයට නිපුණතාවයක් ලෙස සළකන ලද අතර ඉංග්‍රීසි කථනය කෙරෙහි වැඩි අවධානය යොමු කළේය. කාලයක් තිස්සෙ Grammar translation ක්‍රමයෙහි තිබුණු අඩුපාඩු හේතුවෙන් ළමයින්ට විභාග පාස් වුවත් කතා කිරීමට නොහැකි ප්‍රවණතාවක් රට තුළ ඇති වී තිබුණි. ඒ නිසා එම ගැටලුව විසඳීම සඳහා සන්නිවේදනයට විශේෂ අවධානය යොමු කොට නැවත වාචික සන්නිවේදනයටම මුල් තැන ලබා දුණි. එය නැවත direct method ක්‍රමයට පිවිසීමක් වැනිය. දැනට ලංකාවේ පාසල් පද්ධතියෙහි බහුලව පාවිච්චි කරන්නේ ද මෙම ක්‍රමයයි. විශ්වවිද්‍යාල වල ගුරුවරු රිසි සේ අභිමත ක්‍රමවේද භාවිත කරති.

## ඍජු ක්‍රමය (Direct Method / Natural Method)

චාල්ස් බර්ලිට්ස් විසින් හඳුන්වා දෙන ලද මෙම Direct Method ඉගැන්වීමේ ක්‍රමය Natural Method ලෙසද හැඳින් වේ. මෙය 1900 දී පමණ ජර්මනියේ සහ ප්‍රංශයේ ස්ථාපිත විය. එය Grammar Translation Method ක්‍රමවේදයට පිළිතුරක් ලෙස පෙනී ගියේය. ඒ අනුව මෙම ඉගැන්වීමේ ක්‍රමය 20 වන සියවසේ මුල් භාගයේදී හඳුන්වා දෙන ලදි.

Direct Method ඉගැන්වීමේ ක්‍රමය මගින් පන්ති කාමරයේ මව් භාෂාව භාවිත කිරීම බැහැර කරන ලද අතර ඉලක්ක ගත භාෂාව පමණක් භාවිත කිරීම අනුගමනය කරන ලදි. මෙම ක්‍රමයෙහි ප්‍රධානම න්‍යාය එයයි. ඉංග්‍රීසි උගන්වන්නේ නම් සිංහලෙන් කතා නොකිරීමට වගබලා ගැනීම මෙහිදී සිදුවේ. කථනයට, උච්චාරණයට ප්‍රධාන තැනක් ලබා දෙන අතර ලේඛනය යනුවෙන් වෙනම ඉගැන්වීමක් හෝ විශේෂ තැනක් ලබා නොදේ.

අධිරාජ්‍ය යුගයෙහි ලංකාවෙහි මෙම ක්‍රමය භාවිතව තිබී ඇත. ඉංග්‍රීසි ජාතිකයන්ට සිංහල නොහැකි වීම ද මෙම ඉගැන්වීමේ ක්‍රමය භාවිත කිරීමට ප්‍රධාන හේතුවක් විය. 1956 පසු ලංකාවෙහි සම්මත ක්‍රමවේද අනුව විදේශ භාෂා ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස භාවිතයට ගන්නා ලද අතර, සම්මත ක්‍රමයක් ලෙස 1956න් පසු පාසල්වලද Direct Method භාවිතයට ගැනුණි. එහි අඩුපාඩු ලෙස Direct

Method භාවිතයේදී බොහෝ දෙනෙකුට භාෂා ග්‍රහණය අපහසු වීම හඳුන්වා දිය හැකිය. එයට හේතුව ඒ සඳහා සරිලන භාෂා දැනුම් පරිසරයක් ලංකාවෙහි නොමැති වීමයි. ගැඹුරු ව්‍යාකරණ දැනුමක් ද නොලැබීම වැනි කාරණා හේතුවෙන් ලංකාවේ විදේශ හෝ දෙවන භාෂා ඉගැන්වීම් ක්‍රමය Grammar Translation ක්‍රමවේදය වෙත මාරු විය. ශ්‍රී ලංකාවෙහි අගනුවරට පමණක් Direct Method ඉගැන්වීමේ ක්‍රමය ඵලදායී වුවත් ග්‍රාමීය ප්‍රදේශ සඳහා ඵලදායී නොවන බව අනුමාන කළ හැකිය.

## ව්‍යාකරණ පරිවර්තන ක්‍රමය (Grammar Translation Method)

ශ්‍රී ලංකාව තුළ පසුගිය දශක කීපයක සිට අද දක්වා බහුලව භාවිත කරන දෙවන භාෂා ඉගෙනීම් ක්‍රමයක් වන මෙය 1840 සිට 1940 දක්වා ලෝකයේ ජනප්‍රිය ඉගැන්වීම් ක්‍රමයක්ව පැවතිණ. 19 වන සියවසේදී ප්‍රංශ, ජර්මන්, ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා මෙම ක්‍රමය භාවිතයට ගෙන තිබේ.

සන්නිවේදන මාධ්‍ය ලෙස තම මව් භාෂාවෙන් ගනුදෙනු සිදු කරන අතර ව්‍යාකරණය හුදකලාව අධ්‍යයනයට යොමු කරයි. වෙනම ව්‍යාකරණ පාඩම් වශයෙන් පිළිවෙළට උගන්වනු ලැබේ. මෙහි ඇති විශේෂම ලක්ෂණය නම් තමන්ගෙ මව් බසින් ව්‍යාකරණ මාතෘකාවකට අනුව (කර්තෘ කාරක, කර්ම කාරක යනාදි වශයෙන්) වාක්‍ය ලබා දෙමින් ඉලක්ක ගත භාෂාවට එම වාක්‍ය පරිවර්තනය කිරීමට සැලැස්වීමයි. ව්‍යාකරණයේ සංකීර්ණතා පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීම් සපයනු ලබයි. වාග්කෝෂය හුදකලා වචන ලැයිස්තුවක් ආකාරයෙන් උගන්වනු ලබයි. ද්වි භාෂා වචන ලැයිස්තු මත වාග් කෝෂය ඉගෙනීම, පද යෙදුම්, පද පිළිවෙළ සඳහා නීති සම්පාදනය කිරීම, වචනවල ස්වරූපය සහ භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීම, අන්තර්ගතය කෙරෙහි වැඩි අවධානයක් නොකිරීම, වාචික භාවිතය සඳහා ඉඩකඩ ලබා නොදීම, ව්‍යාකරණමය රීති ඉදිරිපත් කිරීම, ව්‍යාකරණ අභ්‍යාස, කියවීම හා ලිවීම පිළිබඳ අවධානය යොමු කිරීම යනාදිය මෙම ක්‍රමවේදයෙහි සුවිශේෂ ලක්ෂණ ලෙස ඉදිරිපත් කළ හැකිය.

මේ ක්‍රමය යටතේ ළමයින්ගේ ශ්‍රවණ හැකියාව බිඳ වැටිණි. එමගින් කථන හැකියාව ද අඩු විය. ලෝකයේ වෙනත් රටවල් මෙම ක්‍රමය ප්‍රතික්ෂේප කරන ලද අතර ශ්‍රී ලංකාවේ භාවිතයට ගැනිණ. ලංකාවේ

තවමත් ඉංග්‍රීසි උගන්වන බොහෝ ස්ථානවල භාවිත වන්නේ මේ ක්‍රමයයි. වෙන ක්‍රමයක් මිනිසුන් නොදැන සිටීම එයට එක් හේතුවකි. භාෂා ඉගැන්වීමේදී ව්‍යාකරණ හැකියාව, ලේඛන හැකියාව ඇතිකිරීම අතින් ඉහළ මට්ටමක තිබුණත් ලෝකයෙහි වාග්විද්‍යාඥයන් විසින් මෙය යල් පැනගිය ක්‍රමයක් ලෙස සලකා බැහැර කරන ලදි.

## ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රමය (Audio Lingual Method -1950)

දෙවන ලෝක සංග්‍රාමය පැතිරයාමත් සමඟ හමුදාවන්ට හැකි ඉක්මනින් ඔවුන්ගේ සඟයන්ගේ හා සතුරන්ගේ භාෂාවන්හි ප්‍රවීණත්වයක් ලබා ගැනීමට අවශ්‍ය විය. මෙම ඉගැන්වීමේ තාක්ෂණය මුලින් හමුදා ක්‍රමය ලෙස හැඳින් වූ අතර එය වාග්විද්‍යාත්මක න්‍යාය සහ මනෝවිද්‍යාව මත පදනම් වූ බැවින් භාෂා ඉගැන්වීමේ මුල්ම විද්‍යාත්මක ක්‍රමවේදය විය. Direct method ක්‍රමයෙහි මූලධර්ම හා ක්‍රියා පටිපාටීන් බොහෝමයක් මෙම ක්‍රමවේදයට අනුගත විය. ස්කිනර්ගේ චර්යාත්මක න්‍යාය මත පදනම්ව දැඩි ක්‍රමයක් භාවිත කරමින් මිනිසකු පුහුණු කළ හැකි බව මෙහිදී උපකල්පනය කෙරිණ. නිවැරදි භාෂා භාවිතය සඳහා සාර්ථක ප්‍රතිචාර දෙනු ලබන අතර භාෂාමය දෝෂ වළක්වා ගැනීම සඳහා විශේෂ සැලකිල්ලක් යොමු කෙරේ.

භාෂාවේ නව ප්‍රවේශයන් සංවාද ලෙස ඉදිරිපත් කිරීම, පාඩම ඉලක්ක භාෂාවෙන් සිදු කිරීම, එදිනෙදා සංවාද රටා අත්පත් කර ගැනීම, ව්‍යාකරණ පැහැදිලි කිරීම් අවම මට්ටමක පැවතීම, සංවාද කටපාඩමින් මතක තබා ගැනීම, අන්තර්ගතය හා අර්ථය නොසලකා හැරීම, ඉලක්ක ගත භාෂාවේ හැසිරීම කෙරෙහි අවධානය, භාෂා විද්‍යාගාර ශ්‍රව්‍ය සහ දෘශ්‍ය ආධාරක බහුලව භාවිතයට ගැනීම, වාක්‍ය රටාවන් එක්වරකට එකක් පමණක් බැගින් උගන්වනු ලැබීම යනාදි කරුණු මෙම ඉගැන්වීම් ක්‍රමයෙහි ලක්ෂණ ලෙස ඉදිරිපත් කළ හැකිය.

ගුරුවරයා විධානයක් දෙනු ලබන අතර ශිෂ්‍යයා ඒ අනුව කටයුතු කරයි. ගුරුවරයා පවසන දෙය නැවත ඒ ලෙසම උච්චාරණය කරවමින් ඉගැන්වීමක් මෙහිදී සිදු වේ. කටපාඩම් කිරීම සහ හුරු කිරීම මෙම ඉගැන්වීම් ක්‍රමයේ ස්වභාවයයි. Audio Lingual Method නූතන ලෝකයේ පොඩි ළමයින් සඳහා භාෂා ඉගැන්වීමේ සාර්ථක ක්‍රමයක් ලෙස International school, child nursery schools වැනි ස්ථානවල භාවිතයට ගනී.

## කාර්ය මූලික භාෂා ඉගෙනීම (Task- Based Language Learning)

වෛද්‍යවරයකු හමුවට යෑම, සම්මුඛ පරීක්ෂණයකට පෙනීසිටීම, පාරිභෝගික සේවාවක් සඳහා දුරකථනයෙන් සම්බන්ධ වීම වැනි අවස්ථාවන්ට අදාළ තෝරාගත් සිද්ධියක් මවා සිද්ධීන්ට අනුව භාෂාවක් ඉගැන්වීම මෙම ක්‍රමය යටතේ සිදු කෙරේ. භාෂා ආකෘතිවල නිරවද්‍යතාවට වඩා කාර්යයන් නිසි අයුරින් සම්පූර්ණ කිරීම වෙසෙසින් සලකා බැලේ. Task- based language learning ක්‍රමය භාෂා චතුරතාව සහ සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීම සඳහා බෙහෙවින් ජනප්‍රිය වූ ක්‍රමවේදයකි.

Task- Based Language Learning ක්‍රමවේදයෙහි ඉගෙනුම් ක්‍රියාවලිය පූර්ව කාර්යය අවධිය, කාර්යය ඉටුකිරීම් අවධිය සහ පශ්චාත් කාර්යය අවධිය යන ලෙසින් අධියර තුනකින් දක්වා තිබෙන අතර ගුරුවරයාගේ කාර්යභාරය අධියරෙන් අධියරට වෙනස් වේ. ගුරුවරයා සාමාන්‍ය වේගයෙන් සාමාන්‍ය භාෂාව භාවිත කරයි, නිවැරදි පිළිතුරු සොයා ගැනීමට ඉගෙන ගන්නන්ට උපකාර කරයි, භාෂාව භාෂාමය සංවර්ධනය සඳහා පමණක් නොව කාර්යයන් ඉටුකිරීම සඳහා යොදා ගනී, අව්‍යාජ භාවිතයන් මගින් ශිෂ්‍යයා දිරිමත් කරයි.

## The Structural Situational Approach

මෙම ප්‍රවේශයේදී ගුරුවරයා භාෂාව උගන්වන්නේ ප්‍රවේසමින් කරන තෝරා ගැනීම් අනුවය. ශ්‍රේණිගත කිරීම් (ලකුණු ලබාදීම) , වචන මාලාව ඉදිරිපත් කිරීම් ආදි ක්‍රියාකාරකම් පදනම් කර ගත් ක්‍රමවේද මගිනි.

## ද්විභාෂා ක්‍රමය (Bilingual Method)

ද්විභාෂා යන වචනයේ තේරුම භාෂා දෙකක් චතුර ලෙස කථාකිරීමේ හැකියාවයි. ද්විභාෂා ක්‍රමයේදී ගුරුවරයා භාෂාව උගන්වන්නේ මව් භාෂාවට සමාන වචන හෝ වාක්‍ය ලබාදීමෙනි. මෙම ක්‍රමය C.J. Dodson විසින් වැඩිදියුණු කරන ලදි.

## සම්පූර්ණ ශාරීරික ප්‍රතිචාර (Total Physical Response)

Total Physical Response ඉගැන්වීමේ ක්‍රමවේදය "භෞතික ප්‍රතිචාර සමඟ සම්බන්ධ වීමෙන් මතකය වැඩිදියුණු වේ." යන න්‍යාය මත පදනම් වේ.

## නිහඬ මාර්ගය (The Silent Way)

The Silent Way ක්‍රමයේදී ගුරුවරයා සිසුන්ගේ අවධානය යොමු කිරීම සඳහා නිශ්ශබ්දතාව සහ අභිනයන් භාවිත කරයි. මෙම ක්‍රමය Caleb Gattengo විසින් වැඩිදියුණු කරන ලදි.

## Eclectic Approach

මෙය භාෂා ඉගැන්වීමේ තවත් ඉගැන්වීම් ක්‍රමයකි. Larsen – Freeman සහ Mellow (2000) හඳුන්වා දෙන ලදි. භාෂා ඉගැන්වීම සඳහා බහුවිධ ප්‍රවේශය Eclectic Approach ඉගෙනුම් ක්‍රමවේදය යනු පාඩමේ අරමුණු සහ ඉගෙන ගන්නන්ගේ හැකියාවන් මත පදනම්ව, භාෂාව ඉගැන්වීම සඳහා විවිධ ප්‍රවේශයන් හා ක්‍රමවේදයන් ඒකාබද්ධ කරන භාෂා ඉගැන්වීම් ක්‍රමයකි. මෙම ක්‍රමවේදයෙන් විවිධ ඉගැන්වීම් ක්‍රම ණයට ගත් අතර ඉගෙන ගන්නන්ගේ අවශ්‍යතාවට අනුවර්තනය විය. එය පන්තියේ ඒකාකාරය බිඳ දමයි. භාෂා ඉගැන්වීම සඳහා විවිධ ප්‍රවේශයන් සහ ක්‍රම භාවිත වේ. ගුරුවරයාට මෙම විවිධ ක්‍රම හා ප්‍රවේශ අභිමත ක්‍රමයක් තෝරා ගත හැකිය. නිදසුනක් ලෙස ව්‍යාකරණ පරිවර්තන ක්‍රමය භාෂා ඉගැන්වීම් ක්‍රමයකි. එමගින් සිසුන් ව්‍යාකරණ රීති ඉගෙන ඉලක්ක ගත භාෂාව සහ මව් භාෂාව අතර පරිවර්තනයන් සිදු කිරීමෙන් එම රීති ක්‍රියාත්මක කරනු ලබයි. හැම ඉගැන්වීම් ක්‍රමයකම සම්මිශ්‍රණයක් වීම Eclectic Approach ඉගෙනුම් ක්‍රමවේදය ලෝකයේ ඉතා ජනප්‍රිය වීමට හේතු විය.

### ඉගෙනුම් ක්‍රමවේදයේ වාසි (Eclectic Approach)

ගුරුවරයාට වැඩි නම්‍යතාවක් ඇත.

භාෂා කුසලතාවයේ කිසිඳු අංගයක් නොසලකා හරිනු නොලැබේ.

පන්ති කාමරයේ විවිධතාවයක් ඇත.

පන්ති කාමර වාතාවරණය ක්‍රියාශීලී වේ.

ගුරු නිපුණතා සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කිරීම, සමීප සංස්කෘතික හා බහු භාෂාමය පන්ති කාමර සැකසුම් සඳහා වැඩි පිළිගැනීමක් හා ගෞරවයක් ලබාදීම පමණක් නොව, ඔවුන්ගේ උරුමය, භාෂාව,

සන්නිවේදන රුචිකත්වයන් සහ ස්වයං අනන්‍යතාව පිළිබඳ ශිෂ්‍ය අභිමානය දිරිගැන්වීම ද සිදුකරයි.

ශ්‍රී ලංකාවේ පළාත් බදව ඉගෙනුම් ක්‍රමවේදවල වෙනසක් දක්නට ලැබීමත්, සමහර ඉගෙනුම් ක්‍රමවේද ප්‍රායෝගික නොවීමත් සලකා පාඩමේ තත්ත්වය අනුව ක්‍රමවේද කීපයක් ඔස්සේ (Eclectic Approach ඉගෙනුම් ක්‍රමවේදය) දැනුම ලබාදිය හැකි නම් ශ්‍රී ලංකාවේ දෙවන භාෂා ඉගැන්වීම් ක්‍රමය මීට වඩා සාර්ථක වන්නට ඉඩ තිබේ.

## දෙවන භාෂාවක් ලෙස භාෂාවක් ඉගැන්වීම සඳහා ලංකාවට වඩාත් ගැළපෙන ක්‍රමය

සාකච්ඡා කරන ලද භාෂා ඉගැන්වීම් ක්‍රම අතුරින් පොඩි ළමයින්ට විශේෂකොට වැදගත් වන්නේ Audiolingual ඉගැන්වීම් ක්‍රමයයි. Direct Method වැදගත් වන්නේ, තම දෙමව්පියන් ඉලක්ක ගත භාෂාවෙන් කථාකරන හෝ ඉලක්ක ගත භාෂාව මව් භාෂාව කර ගත් ළමයින් සහිත පරිසරයකට වන හෙයින්, ලංකාව වැනි දිළිඳු අඩු පහසුකම් සහිත මෙන්ම වෙනත් දියුණු රටවලට සාපේක්ෂව අධ්‍යාපනය වෙනුවෙන් රාජ්‍ය අඩු අවධානයක් යොමු කරන පරිසරයක් තුළ, ශ්‍රී ලංකාවේ දෙවන හෝ විදේශ භාෂා ඉගැන්වීම සඳහා වඩා සාර්ථක ක්‍රමය ලෙස Eclectic Approach ඉගැන්වීම් ක්‍රමය සඳහන් කළ හැකිය.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් වසර 2002 සහ 2003 කාලය තුළ දී සම්පාදිත සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධනය සඳහා වූ ප්‍රතිපත්ති යොජනා ප්‍රකාශය මගින් ලංකාවේ දෙවන භාෂා ඉගැන්වීමක් ලෙස ඉංග්‍රීසි භාෂාව මුහුණ දී ඇති තත්ත්වය පැහැදිලි කරයි. මෙම ප්‍රකාශනය මගින් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයෙහි වර්තමාන තත්ත්වය පිළිබඳ විචාරණයක් කිරීම සහ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ තවත් අවධියක් සැලසුම් කිරීම යන කාරණා අරමුණු කොට ගෙන තිබේ. මෙම ප්‍රකාශයෙහි යෝජනා ඉදිරිපත් කර ඇත්තේ, 2002 වසරේදී ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ පුළුල් ආංශික සමාලෝචනයක් සිදුකිරීමෙන් අනතුරුව බව එම වාර්තාවෙහිම සඳහන් කොට තිබේ. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ තත්ත්වය පහත සඳහන් අයුරින් ඉදිරිපත් වේ.

ඉංග්‍රීසි භාෂාව 'සමාජ විශිෂ්ටතාවෙහි ලාංඡනයක්' වීම වැළැක්වෙන අයුරින් ඉගැන්වීමේ මාධ්‍යය සිංහල හා දෙමළ භාෂාවලට වෙනස් කිරීමත් සමග ඊට සමගාමීව ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය දෙවන භාෂාවක් වශයෙන් සියලුම පාසල්වල ඉගැන්විය යුතු යයි කන්නන්ගර වාර්තාව (1943) යෝජනා කළේය. ඉංග්‍රීසි භාෂාව අඩ සියවසක් පමණ කාලයක් තිස්සේ අනිවාර්ය දෙවන භාෂාවක් වශයෙන් 3 ශ්‍රේණියේ සිට උගන්වා ඇතත් කථන (වාචික) ඉංග්‍රීසි හෝ ලිඛිත ඉංග්‍රීසි හෝ පිළිබඳ ප්‍රවීණතාවක් ශිෂ්‍ය ජනගහණය අතර ඇති වන බව සහතික කිරීමට එය අසමත් වී ඇත. මෙහි ප්‍රතිවිපාකයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාව සමාජ විභේදන කාරකයක් වශයෙන් තවදුරටත් දිගටම පවතී. ඉංග්‍රීසි විරෝධී පරිසරයක් තුළ අඩු ප්‍රමුඛතාවක් හිමි වූ දෙවන භාෂාවක තත්ත්වයට පහත හෙලන පද ඉංග්‍රීසි භාෂාව 1990 වසරවල අග භාගයේ සිට 'අපට ඉංග්‍රීසි අවශ්‍යයඃ අපට ඉංග්‍රීසි වඩාත් අවශ්‍යය' යයි ජනතාව හඬනගා ඉංග්‍රීසි ඉල්ලුම් කරන තත්ත්වයට ඉංග්‍රීසි අධ්‍යාපනය පිළිබඳ බලවත් උනන්දුවක්, වෙනසක් රට තුළ ඇති වී තිබේ **(ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 2003; 1623).**

මෙම වාර්තාව තුළ වර්තමාන ශ්‍රී ලාංකිකයන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උනන්දුවක් දැක්වීමට හේතු ලෙස ඉංග්‍රීසි භාෂාව උපාධිධාරී විරැකියාවට හේතු වන තීරණාත්මක සාධකයක් වශයෙන් ඉස්මතු වීම, එය ශිෂ්‍යයන්ට උද්දීපනාත්මක දැනුම් සමුදායකට පිවිසිය හැකි දොරටුවක් බවට පත්ව තිබීම යන කරුණු දෙක දක්වා තිබේ. ජනගහනයට අයත් සියලු ම කොටස්වලට ඉංග්‍රීසි ඉගෙන ගැනීමට සම අවස්ථා සලසා දීම කාලීන අවශ්‍යතාවක් ලෙස මෙම ප්‍රකාශනයෙහි අවධාරණය කොට ඇත.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ඉදිරිපත් කරන මෙම ප්‍රකාශයෙන් පසුගිය දශක කිහිපය තුළ දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට යොදාගත් Audiolingual, Direct Method, Grammar translation යනාදි ක්‍රමවේද අසාර්ථක ව ඇති ආකාරය පැහැදිලි ව පෙන්වා දී ඇත. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2002-2003) ඉදිරිපත් කරන පරිදි, ඉංග්‍රීසි ප්‍රවීණතාවක් ඇති ගුරුවරුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් තවමත් නොමැති වීම, අසාර්ථක භාෂා ඉගැන්වීම් ක්‍රමයක ලක්ෂණ පෙන්නුම් කරයි.

2009 දී අධ්‍යාපන අමාත්‍යාංශ ජනාධිපති කාර්යය සාධක බලකායෙන් දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා ලංකාවට ගැළපෙන ක්‍රමය ලෙස, බොහෝ මුදලක් වැයකර හඳුන්වා දුන් Communicative Approach ක්‍රමය මේ වනවිට ඉහත වාර්තා ප්‍රකාශයෙන් කියන ලද තත්ත්වය වෙනස් කිරීමට හේතුවක් බවට පත් වී නැත.

අද වන විට ලාංකිකයන් අතර, ශ්‍රී ලංකාවෙහි විදේශ භාෂා ඉගැන්වීම සහ ඉගෙනීම සම්බන්ධව, මීට දශක කිහිපයකට පෙර ඉංග්‍රීසි භාෂාව කෙරෙහි දැක්වූ තරමේ උනන්දුවක්, දක්නා ලැබේ. දෙවන හෝ විදේශ භාෂා ඉගැන්වීම් ඉගෙනීම් ක්‍රියාවලියේදී, ශ්‍රී ලංකාවෙහි භූමිය වශයෙන් සීමිත වපසරියක් තුළ වුවද තවමත් ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙන්වෙන් ඉගැන්වීම් ක්‍රමවේද දක්නට ලැබේ. පැරණි ඉගැන්වීම් ක්‍රම කාර්යක්ෂමව යොදා ගැනීමට අන්තර්ජාතික ප්‍රමිතියෙන් යුතු භාෂාගාර වැනි ආයතන අවශ්‍යවීම, ඒවාට විශාල වශයෙන් මුදල් වැය කිරීමට ලංකාව වැනි තුන්වැනි ලෝකයේ රටවල්වලට නොහැකි වීම, සම්පත් බෙදීයාමේ විෂමතාව වැනි බාහිර කරුණුද ඉහත ක්‍රමවේද ලංකාව තුළ අසාර්ථක වීමට හේතු වශයෙන් දැක්විය හැකිය. එලෙසින් කරුණු සලකා දෙවන භාෂාවක් හෝ විදේශ භාෂාවක් ලෙස ඕනෑම භාෂාවක් ඉගැන්වීම සඳහා ලංකාවට වඩාත් ගැළපෙන ක්‍රමය ලෙස Eclectic Approach යෝජනා කළ හැකිය.

## සමාලෝචනය

භාෂා ඉගැන්වීමේ ක්‍රමවේදය පසුගිය දශක කිහිපය තුළ බොහෝ වෙනස්කම්වලට භාජනය වී ඇත. විධිමත් ක්‍රමවේදයන් යටතේ විදේශ භාෂා ඉගැන්වීම ඇමරිකාව සහ බ්‍රිතාන්‍ය මූලික කොට යුරෝපයේ ආරම්භවීමත් සමඟ විදේශ භාෂා ඉගැන්වීම සඳහා යොදා ගන්නා ලද විවිධ ප්‍රවේශයන් අත්හදා බැලිණි. එහිදී, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා යොදාගත් ක්‍රමයන්හි අසාර්ථකත්වය මත, නව ප්‍රවේශයන් අත්හදා බැලීම හේතුවෙන් දෙවන හෝ විදේශ භාෂා ඉගැන්වීම් ක්‍රමවේදය නව මාවතකට යොමු වී තිබේ. මෙම අධ්‍යයනයෙහිදී, දෙවන හෝ විදේශ භාෂාවක් ලෙස භාෂාවක් ඉගැන්වීම සඳහා ලංකාවට වඩාත් ගැළපෙන ක්‍රමය ලෙස Eclectic Approach ඉගැන්වීමේ ක්‍රමවේදය යෝජනා කෙරේ.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Brown, H.S.(2000). **Principles of Language Learning and Teaching** (4th ed.). New York: Pearson Education

Dianne Larsen-Freeman. 2000. **Techniques and principles in language teaching**. Oxford University Press: Oxford. Retrieved May 10, 2014, from, http://www.scribd.com/doc/43944078/Weaknesses-of-Grammar-Translation-Method.

Hewage, A.K.(2003). **ELT Methodology.** Kalutara: Hewage at Denuma Printers and Publishers(Pvt)Ltd.

Nikolova,I.(2013). **The Direct Method**. Retrieved May 08, 2014, from, http://www.a2zteachers.com/category/learning-english/the-direct-method.

Richards, J. & Rodgers T. (1986). **Approaches and Methods in Language Teaching**. Cambridge: Cambridge University Press.

Richards and Rogers. (2001). **Approaches and Methods in Language Teaching** (2nd ed.). New York: Cambridge University Press.

ශ්‍රී ලංකාව. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2003), **ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා,** සීමාසහිත දීපානී මුද්‍රණ/ප්‍රකාශන (පෞද්ගලික), කොළඹ:

ශ්‍රී ලංකාව. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2016), **ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා,** ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, නුගේගොඩ: